# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2090/38 - 2018 සැප්තැම්බර් මස 28 වැනි සිකුරාදා - 2018.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1988 අංක 83 දරන රේගු ආඥාපනත

රේගු (සංශෝධිත) ආඥාපනතේ (235 වන අධිකාරය) 103බී (1) වගන්තිය අනුව මා වෙත පැවරි ඇති බලතල ප්‍රකාරව මංගල සමරවීර වන මා විසින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා වශයෙන් බහාළුම් තොග වලට වඩා අඩු බඩු (LCL) සඳහා රට තුළ නිෂ්කාෂණ මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම අරමුණු කරගෙන මෙමගින් නියෝග පනවනු ලැබේ. මෙම නියෝග 2018 ඔක්තෝබර් මස 01 වැනි දින සිට බල පැවැත්වේ.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 ක් වූ සැප්තැම්බර් මස 28 වැනි දින,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
කොළඹ 01.

නියෝග

01. මෙම නියෝග බහාළුම් තොග වලට වඩා අඩු බඩු (LCL) සඳහා රට තුළ නිෂ්කාෂණ මධ්‍යස්ථාන (ICD) ස්ථාපනය කිරීමේ නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

02. මෙම නියෝගවල අරමුණ වන්නේ වැඩි වී ඇති ජාත්‍යන්තර වෙළඳ ප්‍රවාහය සඳහා පහසුකම් සැලසීම හා කොළඹ වරායේ ඇති තදබදය අඩු කිරීම සඳහා පහසුකම් සැලසීම හා බහාළුම් තොග වලට වඩා අඩු බඩු (මෙහි මින් මතු LCL යනුවෙන් හැඳින්වෙන) පිළිබඳ බහු රාජ්‍ය ඒකාබද්ධ කිරීම් ඇතුළු ආනයන, අපනයනය හා ප්‍රති නැව්ගත කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා රට තුළ නිෂ්කාෂණ මධ්‍යස්ථාන (මෙහි මින්මතු "ICD" යනුවෙන් හැඳින්වෙන) ස්ථාපනය කිරීම මගින් ශ්‍රී ලංකාව තුළ බහාළුම් තොග වලට වඩා අඩු බඩු තොග නිෂ්කාෂණ මෙහෙයුම් සඳහා ඉඩ සැලසීම යි.

03. ICD ස්ථාපනය කිරීම රේගු ආඥාපනතේ 103 ඒ වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ සිදුකල යුතු අතර මෙහෙයුම් සඳහා වන උපදෙස් හා මාර්ගෝපදේශ, රේගු ආඥාපනතට අනුකූලව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කළ යුතු ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

04. ගරු මුදල් අමාත්‍යවරයා විසින් එකී ICD සඳහා අනුමැතිය ලබා දිය යුතු අතර ශ්‍රී ලංකා රේගුව විසින් ගැසට් පත්‍රයේ පලකළ යුතු ය.

05. ICD ස්ථාපනය කිරීම සඳහා පහත සඳහන් යෝග්‍යතා නිර්ණායක සපුරාලිය යුතු ය.

5.1 ICD පහසුකම කළමනාකාරිත්වය සඳහා ශක්‍යතාවයෙන් යුක්ත විය යුතු අතර භාවිතා කරන්නන් සඳහා ආකර්ශණීය විය යුතු ය. අනාගත ICD ක්‍රියාකරුවන් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමකට පත්වන පරිදි මාසිකව අඩි විස්සේ සමාන ඒකක (TEU) 500 (දෙපසටම)ක වෙළඳාමක් සනාථ කල යුතු වේ.

5.2 අවම ආයෝජනය රු. මිලි. 500ක් විය යුතු ය.

5.3 ඉඩම් අවශ්‍යතාවය

භූමිය හා ගුදම් ප්‍රදේශය ද ඇතුළත්ව, ICD ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය අවම ඉඩකඩ අවශ්‍යතාවය වර්ග අඩි 125,000ක් විය යුතු ය.

5.4 ICD සැලසුම් කිරීම හා සකස් කිරීම

(අ) සැලසුම් කිරීම හා සකස් කිරීම, ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් යාන්ත්‍රික/විද්‍යුත් පහසුකම් වලින් යුතු අති නවීන තාක්ෂණයෙන් සමන්විත විය යුතු ය. ICD හරහා බහාළුම්, නැව් බඩු හා වාහන බාධාවකින් තොරව ගලායාම මනා සැලසුමක් සකස් කිරීම සඳහා වන ප්‍රධාන සාධකය වේ. සැලසුම් සකස් කිරීමේදී ව්‍යාපාරයේ මූලික පරිමාව, ඉදිරි වසර 10 දී ඇස්තමේන්තුගත පරිමාව හා අපනයනකරුවන්ට අවශ්‍ය විය හැකි පහසුකම් ආදිය පිළිබඳව සැලකිලිමත් විය යුතු ය. මෙම සැලසුම්, අතුරු මාර්ග (දුම්රිය මාර්ග), බහාළුම් අංගන, ඉදිරි ආරක්ෂක කුටි හා ආරක්ෂක අංග, මායිම් තාප්ප (වැටවල්), මාර්ග, පදික වේදිකා, කාර්යාල ගොඩනැගිලි හා පොදු පහසුකම්, ආදී ලක්ෂණ වලින් යුක්ත විය යුතු ය. මාර්ග වල දිග හා මාර්ග ප්‍රමාණය දුම්රිය පරිහරණය කිරීමට හා අවශ්‍ය විටක නවතා තැබීමට ප්‍රමාණවත් විය යුතු ය.

(ආ) එය වටා ඇති වැට හා අලෝකකරණය රේගු බලධාරීන් විසින් අවශ්‍ය කරන ප්‍රමිතියෙන් යුක්ත විය යුතු ය. පරිශ්‍රයේ ආරක්ෂාව සඳහා වන ප්‍රමුඛ ලක්ෂය වශයෙන් ගේට්ටු මනාව සැලසුම් කළ යුතු ය.

(ඇ) නැව් බඩු හා බහාළුම් හා සම්බන්ධ සියළු ලේඛන සම්බන්ධයෙන් කටයුතු කරන මූලික ස්ථානය පරිපාලන ගොඩනැගිල්ල වන අතර එම ස්ථානයේ සේවය කරන සේවක සංඛ්‍යාව අනුව එහි ප්‍රමාණය තීරණය කරනු ඇත. සනීපාරක්ෂක පහසුකම් හා හැකි අයුරින් ආහාර සැපයීමේ පහසුකම් සඳහා ස්ථාවර ප්‍රතිපාදන සැලසිය යුතු ය.

(ඈ) ගබඩා හා සියළු ප්‍රවේශ හා පිටවීමේ ස්ථාන ඇතුළු සම්පූර්ණ පරිශ්‍රය සඳහා සංවෘත පරිපථ රූපවාහිනි අවේක්ෂණ පද්ධතියක් (CCTV) ස්ථාපනය කළ යුතු අතර එය ශ්‍රී ලංකා රේගු මූලස්ථානය සමඟ සම්බන්ධ කළ යුතුය.

(ඉ) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා/රේගු අධ්‍යක්ෂ (කර්මාන්ත හා සේවා අංශය) විසින් පිලිගනු ලබන පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මනා වාර්තා තබා ගැනීමේ පද්ධතියක් තිබීම.

(ඊ) වෙන් වෙන්ව පිහිටි ප්‍රවේශ හා පිටවීමේ මාර්ග සහිත ගේට්ටු සංකීර්ණය.

(උ) පරිශ්‍රයට ඇතුළුවීමට බලා සිටින වාහන සඳහා අවශ්‍ය පමණ නවතා තැබීමේ ඉඩකඩ.

(ඌ) රේගුව මගින් විශේෂයෙන් දක්වන ලද ප්‍රමිතීන්ට අනුව මායිම් තාප්පය.

(එ) ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ASYCUDA පරිගණක පද්ධතියට සම්බන්ධ කිරීමට සුදුසු පරිගණකගත ලේඛන සැකසීමේ පද්ධතිය.

(ඒ) ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව/මුදල් අමාත්‍යාංශය මගින් පිළිගත් පරිගණක ගත නැව් බඩු තොග ඉන්වෙන්ටරි පාලන පද්ධතිය.

5.5 ICD සඳහා උපකරණ ස්ථාපනය

ICD සඳහා බදු පැටවීම, බඩු බෑම, අඩුක් කිරීම, එහා මෙහා ගෙනයාම, බඩු තොග පරිහරණය, බඩු පිරවීම, හිස් කිරීම සඳහා නවීන භාණ්ඩ පරිහරණ උපකරණ තෝරාගත යුතු ය.

5.6 ICD පිහිටීම

භාවිතා කරන්නන් සඳහා සතියේ දින හත (07) තුළ පැය 24 පුරාම බඩු තොග එහා මෙහා ගෙනයාම හා පරිහරණය සඳහා පහසුකම් සැලසීම සඳහා ICD ජාත්‍යන්තර වරායක හෝ ගුවන් තොටුපලක සිට සාධාරණ දුරකින් පිහිටිය යුතු අතර වරායේ සිට ICD දක්වා වන ප්‍රවේශ මාර්ග බර බහාළුම් ගමන් කිරීම සඳහා සුදුසු විය යුතු ය.

5.7 ඉල්ලුම්පත් සකස් කිරීමේ ගාස්තු

රු. 100,000/- ක ඉල්ලුම්පත් සකස් කිරීමේ ගාස්තුවක් අයකල යුතු ය. මෙය ශ්‍රී ලංකා රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.

5.8 ICD සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තුව

රු. 500,000/- බලපත්‍ර ගාස්තුවක් අයකල යුතු ය. මෙය ශ්‍රී ලංකා රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.

12- 165

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.